**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2014 අප්‍රේල් 29 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනය 2013 මැයි 13 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අංක 53-6134 දරන කැබ් රථයේ වටිනාකම වූ රු.1,500,000 ක්ද, පරිගණක මුද්‍රණ යන්ත්‍රයෙහි වටිනාකම වූ රු.15,500 ක්ද, ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ වටිනාකම වූ රු.774,000 ක්ද සහ ප්‍රජාශාලා 11 ක වටිනාකම වූ රු.2,040,000 ක්ද මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම ගණනය කර නොතිබූ අතර විගණන ගාස්තු සඳහා වෙන්කිරිමක් ද සිදුකර නොතිබුණි.

(ඇ) වර්ෂයේ අවසන් ඉතිරි තොගය රු.13,767 ක් අඩුවෙන් දක්වා තිබූ අතර, 2012 නොවැම්බර් 22 දින ආපසු ගෙවන ලද සියයට 10 රඳවුම් මුදල් රු.28,500ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස දක්වා තිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 10,540,765 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.845,515 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.72,811 ක් විය.

**2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.10,324,438 ක් වූ අතර, වසරක් ඉක්මවා හිඟ හිට තිබූ ශේෂය රු.21,000 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.9,216,911 ක් වූ අතර, වසර දෙක ඉක්ම වූ ශේෂය රු.628,155 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i). | බදු කුලී | 1,687 | 720 | 967 |
| (ii). | බලපත්‍ර ගාස්තු | 141 | 100 | 41 |
| (iii). | උසාවි දඩ | 2,436 | 2,042 | 394 |
| (iv). | වෙනත් ආදායම් | 14,164 | 507 | 13,657 |

2.2.2 බදු කුලී

-----------

2009 ඔක්තෝබර් 02 දින, සභාවට අයත් පුස්තකාල ගොඩනැඟිල්ල කිරිමැටියාව සමෘද්ධි බැංකු සංගමයට 2011 නොවැම්බර් දක්වා මාසික කුලී පදනම මත බදු දී තිබුණි. 2010 අප්‍රේල් මස සිට විගණිත දිනය වූ 2014 මැයි 02 දින දක්වා හිඟ කඩ කුලී රු.18,000 ක් අයකරගෙන නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

**3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

**------------------------------------------------**

2003 ජුනි 18 දින සභාවට ලබා දී තිබු රු.332,500ක් වටිනා මිනි කුබෝටා ට්‍රැක්ටරය හා ට්‍රේලරය වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවති අතර, මේ දක්වා එහි අයිතිය පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

2014 ජනවාරි 20 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි අන්තර් සම්බන්ධිත ගල් සහ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරන ලද මාර්ග කිහිපයක පහත දුර්වලතාවයන් අනාවරණය විය.

(අ) කොන්ක්‍රීට් ගැටිති දෙපස අඩි 02 ක් පළලට ප්‍රමාණවත් තරම් බොරළු දමා නිසි පරිදි තලා නොතිබීම.

(ආ) මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් ගැටිති පුපුරා තිබු අවස්ථාවන් නිරීක්ෂණය විය.

(ඇ) කොන්ක්‍රීට් ගැටියේ පළල හා උස ඇස්තමේන්තු ප්‍රකාරව නොතිබීම.

(ඈ) අන්තර් සම්බන්ධිත ගල් ඇතිරීමේ දී ඒකාකාරී මට්ටමක නොතිබීම.

(ඉ) ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනවලට ඉටුනොකල කර්මාන්තවල ගිවිසුම්ගත කාලය දීර්ඝ කිරීමට ක්‍රියාකර නොතිබීම.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාර්ග නඩත්තු බදු මුදල් අයකිරීම වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබීම නිසා සභාවට එම බදු මුදල් අයකරගත නොහැකිව තිබුණි.

(ආ) අන්තර් සම්බන්ධිත ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් නිෂ්පාදන ගිණුමක් සකස් කිරීම තුලින් ඒකක නිෂ්පාදන පිරිවැය ගණනය කර නොතිබූ අතර, ව්‍යාපෘතියේ ලාභඅලාභ වෙන්වෙන්ව ගණනය නොකර එය ආදායම් හා වියදම් ගිණුමේ අන්තර්ගත කර තිබුණි.

(ඇ) අන්තර් සම්බන්ධිත ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ස්ථිර ස්ථානයක් නොතිබුණු අතර, එය දැනට පොළ භූමියේ පවත්වාගෙන යමින් තිබුණි.

(ඈ) 2013 සැප්තැම්බර් 15 දින අනතුරටපත් අංක 252 – 6364 දරන කැබ් රථය විගණිත දිනය වූ 2014 ජූනි 02 වන දින වන විටත්, අළුත්වැඩියා කටයුතු සිදුකර ධාවනයට යොදවාගෙන නොතිබුණි.

(ඉ) සභාවේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.5,751,463 ක් වටිනා ඉඩම් හා ගොඩනැඟිලි හිමිකම් ඔප්පුවකින් හෝ බලපත්‍රයකින් සභාවට පවරා ගෙන නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645 හා 1646 ප්‍රකාරව වාහනවලට අදාළ ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4** **අභ්‍යන්තර විගණන**

**----------------------**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය